# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 33 දරන
# නීති අධ්‍යාපන සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අගෝස්තු මස 13 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1993 අංක 33 දරන නීති අධ්‍යාපන සභා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 11 වන දින]

**එල්. ඩී.—ඕ. 50/91**

**නීති අධ්‍යාපන සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව **විසින් මෙසේ** පනවනු ලැබේ :—

**1.** මේ පනත 1993 අංක 33 දරන නීති අධ්‍යාපන සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 2අ වගන්තිය **පහත දැක් වෙන පරිදි මෙයින් සංශෝධනය** කරනු ලැබේ :— 276 වන අධිකාරයේ 2අ වගන්තිය සංශෝධනය කිරීම.

**(1) ඒ වගන්තියේ** (1) වන උපවගන්තියේ (ඇ) සහ (ඈ) **ඡේද ඉවත් කොට ඒ** වෙනුවට **පහත** දැක්වෙන **ඡේද ආදේශ කිරීමෙන්** :—

“ (ඇ) නීතිපතිවරයා ;

**(ඇඅ) අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන** ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන් දෙදෙ**නෙක් ;**

**(ඇආ) සොලිසිටර් ජනරාල්වරයා ;**

(ඇඇ) (මෙහි මින්මතු “ නම් කරනු ලැබූ සාමාජිකයන් ” **යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා නීතිඥ** සංගමය විසින් ස්වකීය සාමාජිකයන් අතුරෙන් නම් කරනු ලැබූ සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඈ) අමාත්‍යවරයා විසින්, නීති වෘත්තියේ වැදගත් තත්වයක් දරන තැනැත්තන් අතුරෙන් හෝ අධිකරණ තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන් **අතුරෙන් හෝ නීතිය ඉගැන්වීමෙහි හෝ නීති පර්**යේෂණ කටයුතුවල නියුක්ත හෝ නියුක්තව **සිටි තැනැත්තන් අතුරෙන් හෝ නීතිය පිළිබඳ** ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ඇති නැතහොත් නීති ක්ෂේත්‍රයේ දැනුම වර්ධනය කිරීමට දායක වී ඇති තැනැත්තන් අතුරෙන් පත් කරනු ලබන (මෙහි මින් මතු “ පත් කළ සාමාජිකයන් ” යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනෙ**ක් ;’**

2 — ඩී 026950—5,605 (93/04)

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) සෑම නම් කරනු ලැබූ සාමාජිකයකු ම මරණය සිදුවීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් නැතහොත් ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කරනු ලැබුවහොත් මිස, ඔහු නම් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත නම් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය :

එසේ වුව ද නම් කරනු ලැබූ සාමාජිකයකුගේ ධුරයෙහි පුරප්පාඩුවක් පිරවීමට ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නම් කරනු ලැබූ සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3අ) යම් නම් කරනු ලැබූ සාමාජිකයකු විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය අමතන ලද ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය." ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) යම් නම් කරනු ලැබූ සාමාජිකයකුට අසනීප වීම හෝ වෙනත් අබලතාවක් හේතුවෙන් නැතහොත් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින්, ඒ සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීමට සුදුසු හා නිසි තැනැත්තකු පත් කළ හැකි ය." ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "සාමාජිකයන් පස් දෙනකුගෙන්" යන වචන වෙනුවට "සාමාජිකයන් අට දෙනෙකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "යම් සාමාජිකයකු පත් කිරීමෙන්" යන වචන වෙනුවට "යම් සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහිලා" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා උසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.